# මුතු කුමාරිකාව



කතාව සහ චිත්‍ර : ජේ.ඒ. ශෙනුලි නිම්තකී ජයවර්ධන


# මුතු කුමාරිකාව

## කතාව සහ චිත්‍ර


## ජේ.ඒ. ශෙනුලි නිම්තකී ජයවර්ධන



ISBN 978-624-206-748-3

ආදරණීය ගයානි ජයසුන්දර පන්ති භාර ගුරුතුමිය වෙත පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා පිවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එවූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023-11-15

එකමත් එක කාලෙක රාජධානියක ලස්සන කුමාරිකාවක් හිටියා. මේ කුමාරිකාවට හැමෝම කතා කළේ ඩෙස්නි කියලා. ඒ වුණාට මේ කුමාරිකාව එයාගේ නමට ආස වුණේ නැහැ. ඇය නිතරම හිතුවේ එයාට ලස්සන නමක් තිබුණානම් හොඳයි කියලා.



මේ කුමාරිකාවට හාවෙක් හිටියා. මේ හාවාගේ නම ට්‍රිප්සි. ට්‍රිප්සිට කතා කරන්න පුළුවන්.

එක දවසක් මේ කුමාරිකාව ට්‍රිප්සිට මෙහෙම කීවා. “ට්‍රිප්සි, අපි දෙන්නා කැළේ මැදට ගිහින් සෙල්ලම් කරමු”. “හා. අපි යමු” ට්‍රිප්සි කීවා.



දෙන්නම එකට ගමන ඇරඹුවා. දෙන්නා කැලේ මැදටම ආවා. “අද නම් හරිම ලස්සනට මල් පිපිලා තියෙනවා. අපි සෙල්ලම් කරමු” ට්‍රිප්සි කෑගැසුවා.



කුමාරිකාවයි, ට්‍රප්සියි සෙල්ලම් කරන්න හදනකොටම සමනල්ලු රෑන් පිටින් ආවා.



කුමාරිකාව සහ ට්‍රප්සි සමනල්ලු දෙසම බලාගෙන හිටියා.
ඊට පස්සේ මේ දෙන්නා ඒ සමනල්ලු පස්සේ දිවුවා.



ඊට පස්සේ සමනල්ලු රැන් ගුහාවක් ඇතුළට ගියා. මේ ගුහාව ඇතුළට කුමාරිකාවත් ට්‍රප්සිත් ගියා.



“ලස්සන සමනල්ලු විමානයක්” කුමාරිකාව එහෙම කියනවත් එක්කම ලොකු විදුලි එළියක් සහ ලොකු සුළඟක් ආවා. කුමාරිකාව සහ ට්‍රප්සි කට ඇරගෙන ඒ දෙසම බලා සිටියා.



ඒ එක්කම සමනල්ලු කුමාරිකාව සහ ට්‍රිප්සි වටේ කැරකුණා. “මොකක්ද වෙන්නෙ ?” ට්‍රිප්සි බයෙන් ඇසුවා. “මම දන්නේ නෑ” කුමාරිකාව කීවා.



ඒ එක්කම සමනල්ලු මුතු ඇට කුමාරිකාව දෙසට දැම්මා. ඔන්න එතකොටම ලොකු සුළඟ කුමාරිකාව දෙසට ආවා. එතකොට අර මුතු ඇට සුළඟට ඇවිත් කුමාරිකාවගේ ගවුමේ ඇළුණා. ඒ වෙලාවේ කුමාරිකාවගේ ඔටුන්නෙත් ලස්සනට මුතුඇට ඇළුණා. “ඔයා නම් හරිම ලස්සනයි” ට්‍රිප්සි කීවා.



ඊට පස්සේ කුමාරිකාව සමනල්ලුන්ට ස්තූති කරලා ආපසු මාලිගාවට ගියා. එදා ඉඳන් එම කුමාරිකාව මුතු කුමරිය නමින් රට වැසියන් අතර ප්‍රසිද්ධ වුණා. කුමාරිකාවත් එයාගේ මේ අලුත් නමට ගොඩාක් ආසා වුණා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහු විධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ පුමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වග කිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් පූජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට සිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 11.15